**පරිසර පද්ධති සංරක්ෂණය හා කළමනාකරණ ව්‍යාපෘතිය - 2019**

**------------------------------------------------------------------**

පරිසර පද්ධති සංරක්ෂණය හා කළමනාකරණ ව්‍යාපෘතියේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2016 සැප්තැම්බර් 05 දින එළඹී අංක 5792 - එල්කේ දරන මූල්‍ය ගිවිසුමෙහි 2(ආ)(3) වගන්තිය ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු යැයි මා සලකණු ලබන අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

**------------------------------------------------------------------------------**

ව්‍යාපෘතියේ මූල්‍ය ගිවිසුම අනුව, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ ආයතනය නියෝජිතායතනය වන අතර වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව හා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. ශ්‍රී ලංකාවේ තෝරාගත් ස්ථානයන්හී සංරක්ෂණ අරමුණු හා ප්‍රජාවේ ප්‍රතිලාභ සඳහා පරිසර පද්ධති කළමනාකරණ තත්ත්ව වැඩිදියුණු කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණ වේ. නියමු භූ දර්ශන සැලසුම් කිරීම හා කළමනාකරණ, ස්වභාවික සම්පත් තිරසාර ලෙස භාවිතා කිරීම සහ මිනිස් අලි සහජීවනය සහ රක්ෂිත ප්‍රදේශ කළමනාකරණය පිළිබඳ ආයතනික කුසලතා සංවර්ධනය යන ප්‍රධාන කොටස් 03 ක් යටතේ ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක වේ. ගිවිසුම ප්‍රකාරව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 6,504.75 කට සමාන එක්සත් ජනපද ඩොලර් මිලියන 45ක් වන අතර මුළු ණය ප්‍රමාණයම මූල්‍යයනය කිරීමට ජාත්‍යන්තර සංවර්ධන සංගමය විසින් එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2016 දෙසැම්බර් 01 දින ආරම්භ කරන ලද අතර 2021 ජුනි 30 දින නිම කිරීමට නියමිතය.

## 1.3 මතය

**------**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ව්‍යාපෘතියේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව දරන්නා වූ මතය වේ.

ව්‍යාපෘතියේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

**---------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ව්‍යාපෘතිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ව්‍යාපෘතිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ව්‍යාපෘතියේ අඛණ්ඩ පැවැත්මට අදාල කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමයි.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

ව්‍යාපෘතියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වගකීම්, හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරන ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්රකාශන

-----------------

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

----------------------

| | විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වලට අනුව රාජ්‍ය දැව සංස්ථාවට ගෙවිය යුතු රු.5,028,177 ක මුදලක් සටහන් වූ අතර රාජ්‍ය දැව සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන තුල රු.5,671,846 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් රු.643,668 ක වෙනසක් නිරික්ෂණය විය. | වර්ග කිරීමේ දෝෂ. | රාජ්‍ය දැව සංස්ථාව වෙත ජලය හා විදුලි වියදම් සඳහා ප්‍රාදේශීයව ලැබුණු රු.5,028,177 ක් වූ මුදලකි. මෙය සැසඳීම සඳහා වූ අවශ්‍ය ක්‍රියාමාර්ග ඉදිරියේදී ගනු ලැබේ. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති 11 ප්‍රකාරව කෙරීගෙන යන වැඩ මූල්‍ය ප්‍රකාශන තුල ජංගම නොවන වත්කම් යටතේ දක්වනු වෙනුවට රු. මිලියන 482.29 ක් වූ කෙරීගෙන යන වැඩ දේපල පිරියත හා උපකරණ යටතේ දක්වා තිබුණි. | වර්ග කිරීමේ දෝෂයකි. | ඉදිරි මූල්‍ය ප්‍රකාශන තුළින් නිවැරදි කරමි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | ව්‍යාපෘතිය මගින් ක්‍රියාත්මක කරන කොන්ත්‍රාත්වලට අදාල වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ශේෂයන් හා රඳවා ගැනීමේ මුදල් ශේෂයන් රු.මිලියන.68.90 ක් හා රු. මිලියන.26.36 ක් මූල්‍ය | වර්ග කිරීමේ දෝෂයකි. | ඉදිරි මූල්‍ය ප්‍රකාශන තුළින් නිවැරදි කරමි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

තත්ත්ව ප්‍රකාශනයේ ඇතුළත් කර නොතිබුණි.

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්හි භෞතික ප්‍රගතිය

| විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දින වන විට ව්‍යාපෘති කාලයෙන් සියයට 70 ක් ඉක්ම ගොස් තිබුණද එහි මූල්‍ය ප්‍රගතිය සියයට 24 ක් හා භෞතික ප්‍රගතිය සියයට 31 ක අවම අගයක් නිරීක්ෂණය විය. | අභ්‍යන්තර පාලනයේ දුර්වලතා | ව්‍යාපෘතිය ආරම්භ කරන ලද මුල් වර්ෂයන් තුළ ව්‍යාපෘතියේ විශේෂ ස්වභාවය හේතුවෙන් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන නියෝජිත ආයතන දෙකේ ප්‍රශ්න පැන නැගීම හේතුවිය. කෙසේ වුවද මේ බාධක නිවැරදි කරගෙන ව්‍යාපෘතියේ කටයුතු වේගවත් මට්ටමින් කරගෙන යමින් පවති. | ක්‍රියාකාරි සැලැස්මට අනුව කටයුතු කළ යුතුය. |

### 3.2 ව්‍යාපෘති අරමුණුවලින් බැහැරව සිදුකරන ලද බාහිර ක්‍රියාකාරකම්/ ගෙවීම්

| විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) ව්‍යාපෘතියේ ප්‍රසම්පාදන සැලැස්ම වාර 51 ක් වතාවක් සංශෝධනය කර තිබුණි. ව්‍යාපෘතියේ ක්‍රමවත් සංයුක්ත ක්‍රියාකාරි සැලැස්ම හා වාර්ෂිකව පිළියෙල කරනු ලබන ක්‍රියාකාරි සැලසුම් වලට අනුව නිශ්චිත ප්‍රසම්පාදන සැලසුමක් පිළියෙල කිරිමට අපොහොසත් වි තිබුණු අතර නිශ්චිත ක්‍රියාකාරකම් තෝරා | අභ්‍යන්තර පාලනයේ දුර්වලතා | ව්‍යාපෘති යෝජනාව ලෝක බැංකුව වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව කිහිප වරක්ම සංශෝධනය කිරීමට සිදුවිය. කෙසේ වුවද මේ වන විට මුළු ව්‍යාපෘතිය සඳහා නිශ්චිත සැලැස්ම සකස් කරමින් පවති. | ස්ථිර සැලසුමක් අනුව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | නොගැනිම මත ප්‍රතික්ෂේපිත ක්‍රියාකාරකම් නිරික්ෂණය විය. විගණිත දිනය වූ 2020 ජුලි 03 දිනට එහි වටිනාකම ඇමරිකන් ඩොලර් 27,186,606 (ආසන්න වශයෙන් රු.5,029,522,110) ඉහල අගයක් ගෙන තිබුණි. විගණිත දිනය වන විට ව්‍යාපෘතියේ ක්‍රියාත්මක කිරිමට අපේක්ෂා කල ව්‍යාපෘති ක්‍රියාකාරකම් අතුරින් සියයට 52 ක් මේ හේතුවෙන් අවලංගු කර තිබූ අතර විස්තර පහත පරිදි වේ. | | | |
| (ආ) | ව්‍යාපෘතියේ අපේක්ෂිත කාර්යයන් සඳහා වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත 2019 වර්ෂයේ මිලදී ගන්නා ලද රු.509,700 ක පරිගණක යන්ත්‍ර 03ක් උපයෝජනයකින් තොරව ගබඩා පරිශ්‍රය තුල රඳවා තිබුණි. | ඵල රහිත වියදම් | මෙම පරිගණක යන්ත්‍ර 03 භාවිතය සඳහා සුවිශේෂ වූ පරිගණක මෘදුකාංග හා කේෂ්ත්‍ර මුර සංචාර දත්ත එක් රැස් කිරීම වෙනුවෙන් සුවිශේෂි වූ ඇන්ඩ්‍රොයිඩ් මොබයිල් ඩිවයිස් භාවිතා කිරීම අත්‍යාවශ්‍ය වේ. මෙම ඇන්ඩ්‍රොයිඩ් මොබයිල් ඩිවයිස් ව්‍යාපෘතිය විසින් දැනටමත් ඇනවුම් කර ඇති අතර මෙම උපකරණ දේශීය වෙළඳපලින් ලබා ගැනීමට නොහැකි වීම මත විදේශීය වෙළඳ පළෙන් මිලදී ගැනීමට සිදුවිය. මේ වනවිට අවශ්‍ය ප්‍රසම්පාදන කටයුතු කෙරෙමින් පවතින අතර නුදුරේදී කාර්යක්ෂමව කටයුතු කිරීමට හැකි වේ. | නියමිත කාලයට මිලදී ගැනීම් කළ යුතුය. |

## 3.3 විචාරාත්මක ස්වභාවයේ කරුණු

| විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| උපදේශකවරුන්ගේ සේවය ලබාගැනීම සඳහා තෝරා ගැනීමේදී අනුගමනය කළ යුතු මගපෙන්වීමේ 2.2.1 වගන්තිය අනුව රේඛීය අමාත්‍යාංශ ලේකම්ට පවරා තිබුද ඉන් බැහැරව මාස 03 ක කාලයක් සඳහා රු.900,000 ක් ගෙවීමේ පදනම මත සංනීවේදන උපදේශකවරයෙකු ව්‍යාපෘතිය විසින් බඳවා ගෙන තිබුණි. | මාර්ගෝපදේශ වලින් බැහැරව කටයුතු කිරීම. | ලෝක බැංකු අවශ්‍යතාව පදනම් කරගෙන බඳවා ගැනීම් කර ඇති අතර ලේකම්ගේ එකඟතාවය මත සිදුකර ඇත. | ලේකම්ගේ අනුමැතිය ලද පසු බඳවා ගැනීම් කළ යුතුය. |

## 3.4 පද්ධති හා පාලන

| විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ව්‍යාපෘතියේ කාර්යාලය පවත්වාගෙන යාම සඳහා රාජ්‍ය දැව සංස්ථාව සමඟ ව්‍යාපෘතිය එළඹ ඇති ගිවිසුම ප්‍රකාරව බදු කාලය 2020 පෙබරවාරි 08 දින අවසන් වී පැවතියද විගණිත දිනය වූ 2020 ජුලි 07 දින වන විටද නව ගිවිසුම්ගත විමකින් තොරව ව්‍යාපෘති කාර්යාල පරිශ්‍රය භාවිතා කර තිබුණි. | ගිවිසුම් වලින් බැහැරව කටයුතු කිරීම. | 2020 පෙබරවාරි 09 සිට 2020 ජුනි 30 දක්වා වූ කාලයට අදාල නව කොන්ත්‍රාත් ගිවිසුමක් අත්සන් කිරීමට අවශ්‍ය කටයුතු රාජ්‍ය දැව සංස්ථාව සමඟ කටයුතු ක්‍රියාත්මක වෙමින් පවතී. | නියමිත කාලය තුළ ගිවිසුම්වලට එළඹිය යුතුය. |